නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

යම් තැනක නූපදී ද, නොදිරා ද, නොමියේ ද, චුත නොවේ ද, නො හට ගනී ද
ඒ ලෝකයේ කෙළවර පා ගමනින් දත හැකිය, දැකිය හැකිය, පැමිණිය හැකියැ යි
මම නොකියමි.

එනමුදු මම ලොව කෙළවරට නො පැමිණ දුක් කෙළවර කිරීමක් නො ම කියමි.
මම සංඥා සහිත සිත් සහිත බඹයක් පමණ වූ මේ සිරුරෙහි ම ලෝකයත්,
ලෝකසමුදයත්, ලෝකනිරෝධයත්, ලෝකනිරෝධගාමිනී පටිපදාවත් පණවමි.

පා ගමනින් කිසි කලෙක ලොව කෙළවර නො පැමිණිය හැක්කේ ය.
ලොව කෙළවරට නො පැමිණ දුකෙන් මිදීමෙකුත් නැත.

රෝහිතස්ස සූත්‍රය, සංයුත්සඟියේ දේවපුත්තසංයුත්තය

මාගේ අද දිනයේ යෙදී ඇති උපන්දිනය වෙනුවෙන් ධර්මදානයක් ලෙස
මෙම තුටු පඬුර මෙලෙස ඔබ වෙත තිළිණ කිරීමට අප හට සිත්විය.
මේ තුළින් බුදුන් වහන්සේ කෙරෙහි අල්පමාත්‍ර වූ ශ්‍රද්ධාවක් ඔබ සිතෙහි උපන්නේද,
උපන්නාවූ ශ්‍රද්ධාව තව බොහෝ වැඩිදියුණු වූයේද,
එය අද දින ඔබ වෙතින් අප ලද වටිනාම ත්‍යාගය වනු ඇත.

මෛත්‍රීයෙන්
චාමිනී සේනාරත්න සහ රුවන් සේනාරත්න ඇතුළු පවුලේ සැම

බුද්ධ දේශනාව

නවාංග ශාස්තෘ ශාසනය

1. **සුත්ත** – විනය පිටකයේ උභතෝ විභංගය සහ සුත්ත නිපාතයේ මංගල, රතන ආදී සූත්‍ර නාම ලැබූ කොටස්
2. **ගෙය්‍ය** – ගාථා සහිත සෙසු සියලුම සූත්‍ර සහ සංයුත්ත නිකායේ සගාථක වග්ගය
3. **වෙය්‍යාකරණ** – ගාථා ඇතුළත් නොවූ ගැඹුරු අර්ථ ඇතුළත් සූත්‍ර සහ සම්පූර්ණ අභිධම්ම පිටකය
4. **ගාථා** – ධම්මපද, ථෙර ථෙරි ගාථා සුත්ත නිපාතයේ එන සූත්‍ර නාම නොලැබූ ගාථා
5. **උදාන** – නිරාමිස ප්‍රීතිය සහිත වගන්ති
6. **ඉතිවුත්ත** – මේ කාරණය සිදුවන්නේ මේ ආකාරයට යැයි දේශිත දහම් පරියාය
7. **ජාතක** – බෝසත් චරිතයෙහි අතීත සිද්ධීන් ඇතුලත් ජාතක දේශනා
8. **අබ්භූතධම්ම** – තථාගතයන් වහන්සේගේ ජීවිතයට පමණක් අදාළ ආශ්චර්ය අද්භූත සිදුවීම් පිළිබඳ විස්තර
9. **වේදල්ල** – චුල්ල වේදල්ල, මහා වේදල්ල, සම්මා දිට්ඨි ආදී විචාර සංවාද දේසනා

බුද්ධ දේශනාව

- ප්‍රතිපත්ති ධර්මය (ශීලාදි ගුණධර්ම)
- පර්යාප්ති ධර්මය-පිටකත්‍රය (බුද්ධ භාෂිත)
- ප්‍රතිවේද ධර්මය-නව ලෝකෝත්තර ධර්ම (සතර මග, සතර ඵල, නිර්වාණය)

විනය පිටකය
ග්‍රන්ථ 5 කි. ධර්මස්කන්ධ 21000

- පාරාජිකා පාලි
- පාචිත්තය පාලි
- මහා වග්ග පාලි
- චුල්ල වග්ග පාලි
- පරිවාර පාලි

උපාලි මහ රහතන් වහන්සේ ධර්මස්කන්ධ 21000

සූත්‍ර පිටකය
නිකාය වශයෙන් කොටස් 5කි ධර්මස්කන්ධ 21000

අභිධර්ම පිටකය
ග්‍රන්ථ 7 කි. ධර්මස්කන්ධ 42000

- ධම්ම සඞ්ගනිප්පකරණ
- විභඞ්ගප්පකරණ
- ධාතුකථාපකරණ
- පුද්ගලපඤ්ඤත්තිපකරණ
- කතාවත්ථුප්පකරණ
- යමකප්පකරණ
- පට්ඨානප්පකරණ

අකුරු 8 ක් = පද 1 යි.
පද 4 ක් = ගාථා 1 යි.
ගාථා 250 = බණවර 1 යි.
බණවර 1183 ක් = ධර්මස්කන්ධ 84000 යි.

සම්පූර්ණ ත්‍රිපිටකයේ අන්තර්ලත 84000ක් වූ ධර්මස්කන්ධයෙන් 82000 ක් පමණ භාග්‍යවතුන් වහන්සේගේම දේශණා වන අතර 2000 ක් පමණ (මධු පිණ්ඩික සූත්‍රය, චුල වේදල්ල සූත්‍රය වැනි සූත්‍ර දේශණා) ශ්‍රාවකයන් වහන්සේලාගේ දේශනා වේ.

සර්වඥයන් වහන්සේ නමක් විසින් පමණක්ම අවබෝධකොට දේශනා කර වදාරණ ලද දේශනාවකි අභිධර්ම දේශනාව. (විනය පිටකයත් එසේම ය.)

දීඝනිකාය	මජ්ඣිමනිකාය	සංයුත්තනිකාය	අංගුත්තරනිකාය	ඛුද්දකනිකාය
සූත්‍ර 34 බණවර 64 ආනන්ද මහරහතන් වහනසේ	සූත්‍ර 152 බණවර 80 සැරියුත් මහරහතන් වහන්සේගේ ශිෂ්‍ය	සූත්‍ර 7762 බණවර 100 මහා කාශ්‍යප මහරහතන් වහන්සේ	සූත්‍ර 9552 බණවර 120 අනුරුද්ධ මහරහතන් වහන්සේ	කොටස් 18 කි.

1. බුද්දකපාඨ
2. ධම්මපද
3. උදාන
4. ඉතිවුත්තක
5. සුත්තනිපාත
6. විමානවත්ථු
7. පේත වත්ථු
8. ථෙරගාථා
9. ථෙරීගාථා
10. ජාතක
11. නිද්දේස ඃ චූල නිද්දේස මහා නිද්දේස
12. පටිසම්භිදාමග්ගපකරණ
13. අපදාන
14. බුද්ධවංශ
15. චරියාපිටක
16. නෙත්තිප්පකරණ
17. පෙටකොපදෙසො
18. මිලින්ද ප්‍රශ්න

(විවධ ස්ථාන වල මෙම අනුපිළිවෙල විවිධ ආකාරයෙන් දක්වා ඇති බව කරුණාවෙන් සළකන්න).

ත්‍රිපිටක ධර්මයෙහි අනෙකුත් ගුණාංග

විනය · සූත්‍ර · අභිධර්ම

1. **දේශනා වශයෙන්** → විනය පිටකයඃ ආනා දේශනා, සූත්‍ර පිටකයඃ ව්‍යවහාර දේශනා, අභිධර්ම පිටකයඃ පරමත්ථ දේශනා
2. **සාසන වශයෙන්** → විනය පිටකයඃ යථාපරාධ සාසන, සූත්‍ර පිටකයඃ යථානුලෝම සාසන, අභිධර්ම පිටකයඃ යථාධම්ම සාසන
3. **කතා වශයෙන්** → විනය පිටකයඃ සංවරාසංවර කතාව, සූත්‍ර පිටකයඃ දිට්ඨි විනිවේඨන කතාව, අභිධර්ම පිටකයඃ නාමරූප පරිච්ඡේද කතාව
4. **ශික්ෂා වශයෙන්** → විනය පිටකයඃ අධි සීල ශික්ෂාව, සූත්‍ර පිටකයඃ අධි චිත්ත ශික්ෂාව, අභිධර්ම පිටකයඃ අධි ප්‍රඥා ශික්ෂාව
5. **කෙළෙසුන් ප්‍රහාණ කිරීම් වශයෙන්** → විනය පිටකය තදංග වශයෙන් කෙළෙසුන් ප්‍රහාණය කිරීම, සූත්‍ර පිටකය විෂ්කම්භන වශයෙන් කෙළෙසුන් ප්‍රහාණය කිරීම, අභිධර්ම පිටකය සමුච්ඡේද වශයෙන් කෙළෙසුන් ප්‍රහාණය කිරීම.
6. **සමාන ධර්ම** → අර්ථ ගම්භීර, ධර්ම ගම්භීර, ප්‍රතිවේද ගම්භීර, දේශනා ගම්භීර යන සතරම පිටකත්‍රටයම සාධාරණය.
7. **පරියාප්ති භේද වශයෙන්** → අලගද්ද පරියාප්තිය, නිස්සරණ පරියාප්තිය, භාණ්ඩාගාරික පරියාප්තිය
   - අලගද්ද පරියාප්තිය යනු ලාභ සත්කාර, කීර්ති ප්‍රශංසා පිණිස, වාද විවාද පිණිස ධර්මය ඉගෙනීම ය. සර්පයෙකුගේ කඳ මැදින් හෝ වලිගයෙන් හෝ අල්ලා ගත්තා සේ එය විපතට හේතුවේ.
   - නිස්සරණ පරියාප්තිය යනු සසර දුකින් මිදී ශාන්ත නිර්වාණය පිණිස ධර්මය ඉගෙනීම ය.
   - භාණ්ඩාගාරික පරියාප්තිය යනු රහතන් වහන්සේ නමක් විසින් ධර්මය ආරක්ෂා වීම පිනිස ත්‍රිපිටකය ඉගෙනීම ය.
8. **සම්පත්ති වශයෙන්** → විනය පිටකය හැදෑරීමෙන්, පිළිපැදීමෙන්, ත්‍රිවිද්‍යා සහිත අරහත්වය. සූත්‍ර පිටකය හැදෑරීමෙන්, පිළිපැදීමෙන් සත් අභිඥා සහිත අරහත්වය. අභිධර්ම පිටකය හැදෑරීමෙන්, පිළිපැදීමෙන් සත් අභිඥා සහ චතුපටිසම්භිධාඥාන සහිත අරහත්වය.
9. **විපත්ති වශයෙන්** →
   - විනයපිටකය වැරදි ලෙස පිළිගැනීමෙන්, වැරදි ලෙස දේශනා කිරීමෙන්, වැරදි ලෙස අනුගමනය කිරීමෙන් දුශ්ශීල භාවයට පත්ව අපායගාමී වීම.
   - සූත්‍ර පිටකය වැරදි ලෙස පිළිගැනීමෙන්, වැරදි ලෙස දේශනා කිරීමෙන්, වැරදි ලෙස අනුගමනය කිරීමෙන්, වැරදි ලෙස විග්‍රහ කිරීමෙන් දෘෂ්ටිගතිකව අපායගාමී වීම.
   - අභිධර්ම පිටකය වැරදි ලෙස පිළිගැනීමෙන්, වැරදි ලෙස දේශනා කිරීමෙන්, වැරදි ලෙස අනුගමනය කිරීමෙන් විග්‍රහ කිරීමෙන් උමතු බවට පත්වී අපායගාමී වීම.

අභිධර්මය බුද්ධ දේශනාවක්ද ?

සාමාන්‍ය මිනිසකු බුද්ධෝ යන වචනය එක වරක් කියනා විටදී ආනන්ද තෙරුන් හට බුද්ධෝ යනුවෙන් 8 වතාවක් කිව හැකිය. ආනන්ද තෙරුන් බුද්ධෝ යන වචනය එක් වරක් කියනා කල භාග්‍යවතුන් වහන්සේට බුද්ධෝ යනුවෙන් 16 වතාවක් කිව හැකිය. එහෙයින් සාමාන්‍ය මිනිසකු බුද්ධෝ යනුවෙන් එක්වරක් ප්‍රකාශ කරන විට භාග්‍යවතුන් වහන්සේට 128 වාරයක් බුද්ධෝ යනුවෙන් ප්‍රකාශ කළ හැකිය. එවැනි ස්වර සම්පත්තියක් ඇති බුදුරජාණන් වහන්සේ නමකට මෙම අතිමහත් ගාම්භිර අභිධර්ම දේශනාව එක දිගට දේශනා කිරීමට දවස් අනූවක කාලයක් ගතවේ. එමනිසා සියලු බුදුවරුන් මේ සඳහා තෝරාගනු ලබන්නේ තව්තිසා දෙව්ලොවයි. එමෙන්ම මෙම දේශනාව තුන්මාසය ඇතුළත ස්ථාන තුනක දේශනා කරණු ලබයි. අට්ඨකතා ආචාරීන් වහන්සේලාගේ විස්තර කිරීම් අනුව ඒ මෙසේයි. සර්වඥයින් වහන්සේ දෙව්ලොව මෙම දේශනාව කරන තෙමසක කාලය තුල සෑම දිනකම නිර්මිත බුදුරුවක් මවා ඒ මගින් දේශණය නොකඩවා පවත්වාගෙන යාමට අධිෂ්ඨාන කොට, දිවා භෝජනය සඳහා මනුලොව උතුරුකුරු දිවයිනට පැමිණ, පිණ්ඩපාතය පිළිගෙන,අනෝතත්ත විල් තෙරටවැඩමකොට පැන් පහසුවී ඒ අසල ඇති ගන්දමාදන පර්වත මූලයේ දී දන් වළදා ඒ අවස්ථාවේදී එතැනට වඩින සැරියුත් මහරහතන් වහන්සේ හට දවසක් පුරා සිදු කළ දේශනාව සම්පිණ්ඩනය කොට මාතෘකාව උගන්වනු ලබයි. සැරියුත් මහරහතන් වහන්සේ එම දේශනාව යමාමහ පෙළහැර පෑ දවසේ පැවිදි වූ කුලපුත්‍රයන් පන්සීය නමකට මධ්‍යම ප්‍රමාණයට උගන්වනු ලැබේ. ඒ අනුව දෙව් ලොව අති විස්තාර වශයෙන් කරනු ලැබූ දේශනාව මනුලොව අනෝතත්ත විල අසල ගන්දමාදන පර්වත මූලයෙහි අති සංක්ෂේප දේශනාව ලෙසද, සැවැත් නුවර ජේතවනාරාමයේ ශිෂ්‍ය පිරිසට නාති විස්තාර නාති සංක්ෂේප යන මධ්‍යම දේශනාව ලෙස ද වශයෙන් මනුලොව ස්ථාන දෙකකදී අභිධර්මය මුලින්ම දේශනා විය.

එම නිසා මෙම දේශනයේ සම්භවය ප්‍රභවය සිදුවන්නේ බුදුරජාණන්වහන්සේගෙනි. මෙය සප්තප්‍රකරණයට සම්පිණ්ඩනය වන සේ උගන්වනු ලැබුවේ ධර්ම සේනාධිපති සැරියුත් මහරහතන් වහන්සේ විසින්මය.

මෙම රූ සටහන සඳහා කරුණු රැස් කිරීමේදී අති පූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන් වහන්සේ ගේ "අභිධර්මය යනු බුද්ධ දේශනාවක්ද?" යන ධර්ම සාකච්ඡාව බොහෝ උපකාරි විය. එහෙයින් උන්වහන්සේට ද මෙහි අඩංගු කරුණු සඳහා අමතර උපදෙස් ලබාදුන් ඕස්ට්‍රේලියාවේ ඇඩිලේඩ් නුවර පූජ්‍ය පාද උඩගබ්බල ඥාණාලෝක හිමියන්ට ද, කළ්‍යාණ මිත්‍ර ජයන්ත රත්නායක මහතාට ද, මේ සඳහා දායක වෙන සැමට ද වහ වහා නිර්වාණ ධර්මය අවබෝධ වේවායි පතමි. ධර්ම දානය මලින් පුතුට නිරෝගී සුව පිණිස.
www.kalanamithuro.com E-mail - thusitha@free.fr - Facebook-Kalanaworld - Skype - Kalanamithuro

අරියකාන්ත සීලය

ඔබේ සීලය අරියකාන්ත සීලයක් වීමටනම්...

"අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි අච්ඡිද්දෙහි අසබලෙහි අකම්මාසෙහි භුජිස්සෙහි විඤ්ඤුපසත්ථෙහි අපරාමට්ඨෙහි සමාධිසංවත්තනිකෙහි" "නො කැඩුණු සිදුරු නො වුනු, පුල්ලි රහිත, කබර රහිත, තණ්හා දාසභාවයෙන් නිදහස් වුනු නුවණැත්තන් හා ආර්ය වහන්සේලා විසින් ප්‍රශංසාකරන ලද, පරාමර්ෂණය නො කළ (සිතින් දැඩිව නො ගත්) සමාධිය පිණිස පවතින (නිර්වාණය කෙරෙහිම යොමු වූ) සීලය, ආර්යකාන්ත සීලය නම් වෙයි.."

සීලයේ ප්‍රභේද

හානභාගිය සීලය	ඨිතිභාගිය සීලය	විසේසභාගිය සීලය	නිබ්බේධභාගිය සීලය
පිරිහෙන අතට නැමී බරවී ඇති සීලය.	තිබෙන සැටියට වෙනස්නොවී පවතින සීලය.	ධ්‍යානාදී විශේෂයන්ට බරවී පවතින සීලය.	ලෝකෝත්තර මාර්ගයට බරවුණු නැවුණු සීලය.

සතර සංවර සීලය

ප්‍රාතිමෝක්ෂ සංවර සීලය	ඉන්ද්‍රිය සංවර සීලය	ආජීවපාරිශුද්ධි සීලය	ප්‍රත්‍ය සන්නිශ්‍රිත සීලය
"පාතිමොක්ඛ" යනු චාරිත්‍ර වාරිත්‍ර ප්‍රභේද ඇති ශික්ෂාපද වශයෙන් පැනවූ සීලයයි. ඊට අනුකූල වූ කය වචන දෙකෙහි හික්මීම සංවරයයි.	ඇස, කන, නාසය, දිව, කය, මනස යන සය වැදෑරුම් ඉන්ද්‍රියයන්ගේ සංවරය තුලින් නූපන් අකුසල් නූපදවා ගැනීම ඉන්ද්‍රිය සංවර සීලයයි.	ආජීවය සඳහා පනවා ඇති පාරාජිකා, සංඝාදිසේස, ථුල්ලච්චය, පාචිත්තිය, පාටිදේසනීය, දුක්කට නම් වූ සය වැදෑරුම් ශික්ෂා පද කඩ නොකිරීම හා කුහනා ලපනා ආදී වශයෙන් වූ මිථ්‍යා ආජීවයෙන් වැළකීම.	චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස යන මේ සිවුපසය ප්‍රයෝජනය සළකා (ප්‍රත්‍යවේක්ෂාවෙන් යුතුව) පරිභෝජනය කිරීම.

සීලයේ මට්ටම්

පරියන්ත සීලය	අපරියන්ත සීලය	අපරාමට්ඨ සීලය	පටිපස්සද්ධි සීලය
ඥාති පරියන්ත භෝග පරියන්ත ආරෝග්‍ය පරියන්ත ජීවිත පරියන්ත (ඥාතියකු හෝ, භවබෝගයක් හෝ, ජීවිතයට වන අනතුරක් හෝ, ලෙඩ රෝගයක් හෝ නිසා බිඳෙන සීලය).	පරියන්ත සීලය යටතේ දැක්වූ කරුණක් නිසා හෝ වෙනයම් ඕනෑම කරුණක් මත නොකැඩෙන අප්‍රමාණ නිමක් නොමැති සීලය.	සෝවාන් සකෘදාගාමී අනාගාමී ආර්ය ශ්‍රාවකයන්ගේ සීලය.	සියලු කෙළෙස් සංසිඳවූ (අරහත් ඵලයෙන් ලැබෙන්නා වූ) රහතන් වහන්සේලාගේ සීලය.

ගිහි පැවිදි සිල්පද

පඤ්ච සීලය
- ප්‍රාණඝාතයෙන් වැළකීම.
- අදත්තාදානයෙන් වැළකීම.
- කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීම.
- බොරුකීමෙන් වැළකීම.
- සුරාමේරයෙන් වැළකීම.

බ්‍රහ්මචරිය පඤ්ච සීලය
- ප්‍රාණඝාතයෙන් වැළකීම.
- අදත්තාදානයෙන් වැළකීම.
- සියලු කාමයන්හි (සප්ත මෛථුනයන්හි) හැසිරීමෙන් වැළකීම.
- බොරුකීමෙන් වැළකීම.
- සුරාමේරයෙන් වැළකීම.

උපෝසථ අෂ්ඨාංග සීලය
- ප්‍රාණඝාතයෙන් වැළකීම.
- අදත්තාදානයෙන් වැළකීම.
- සියලු කාමයන්හි (සප්ත මෛථුනයන්හි) හැසිරීමෙන් වැළකීම.
- බොරුකීමෙන් වැළකීම.
- සුරාමේරයෙන් වැළකීම.
- නොකල්හි ආහාර අනුභව කිරීමෙන් වැළකීම.
- නැටුම් ගැයුම් වැයුම් කිරීමෙන් හා කරවීමෙන් ද, බැලීමෙන් හා ඇසීමෙන් ද, මල්, සුවඳ විලවුන් දැරීමෙන් ද, ඒවායින් සිරුරේ අඩු තැන් පිරවීමෙන් ද, සම පැහැපත් කිරීමෙන් ද වැළකීම.
- උස් ආසන හා බොහෝ සුව පහසු යහන් පරිහරණයෙන් වැළකීම.

අජීව අට්ඨමක සීලය
- ප්‍රාණඝාතයෙන් වැළකීම.
- අදත්තාදානයෙන් වැළකීම.
- කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීම.
- බොරුකීමෙන් වැළකීම.
- පරුෂ වචනයෙන් වැළකීම.
- කේලාම් කීමෙන් වැළකීම.
- හිස් වචන කීමෙන් වැළකීම.
- අයහපත් ජීවිකාවෙන් වැළකීම.

නවාංග සීලය
- ප්‍රාණඝාතයෙන් වැළකීම.
- අදත්තාදානයෙන් වැළකීම.
- සියලු කාමයන්හි (සප්ත මෛථුනයන්හි) හැසිරීමෙන් වැළකීම.
- බොරුකීමෙන් වැළකීම.
- සුරාමේරයෙන් වැළකීම.
- නොකල්හි ආහාර අනුභව කිරීමෙන් වැළකීම.
- නැටුම් ගැයුම් වැයුම් කිරීමෙන් හා කරවීමෙන් ද, බැලීමෙන් හා ඇසීමෙන් ද, මල්, සුවඳ විලවුන් දැරීමෙන් ද, ඒවායින් සිරුරේ අඩු තැන් පිරවීමෙන් ද, සම පැහැපත් කිරීමෙන් ද වැළකීම.
- උස් ආසන හා බොහෝ සුව පහසු යහන් පරිහරණයෙන් වැළකීම.
- සියලු සත්වයන් කෙරෙහි මෛත්‍රී සහගත සිතින් විසීම සමාදන් වීම.

සාමණේර/දශ සීලය
- ප්‍රාණඝාතයෙන් වැළකීම.
- අදත්තාදානයෙන් වැළකීම.
- සියලු කාමයන්හි (සප්ත මෛථුනයන්හි) හැසිරීමෙන් වැළකීම.
- බොරුකීමෙන් වැළකීම.
- සුරාමේරයෙන් වැළකීම.
- නොකල්හි ආහාර අනුභව කිරීමෙන් වැළකීම.
- නැටුම් ගැයුම් වැයුම් කිරීමෙන් හා කරවීමෙන් ද, බැලීමෙන් හා ඇසීමෙන් වැළකීම.
- මල්, සුවඳ විලවුන් දැරීමෙන් ද, ඒවායින් සිරුරේ අඩු තැන් පිරවීමෙන් ද, සම පැහැපත් කිරීමෙන් ද වැළකීම.
- උස් ආසන හා බොහෝ සුව පහසු යහන් පරිහරණයෙන් වැළකීම.
- රන් රිදී මිල මුදල් පරිහරණයෙන් වැළකීම.

උපසම්පදා සීලය

අංග 227 කින් යුතු භික්ෂු ප්‍රාතිමෝක්ෂය

01. පාරාජිකා	04
02. සංඝාදිසේස	13
03. අනියත	02
04. නිසග්ගි පචිති	30
05. සුද්ධ පචිති	92
06. පාටිදේශනීය	04
07. සේඛියා	75
08. අධිකරණ සමථ	07
එකතුව	227

අංග 311 කින් යුතු භික්ෂුණී ප්‍රාතිමෝක්ෂය

01. පාරාජිකා	08
02. සංඝාදිසේස	17
03. නිසග්ගි පචිති	30
04. සුද්ධ පචිති	166
05. පාටිදේශනීය	08
06. සේඛියා	75
07. අධිකරණ සමථ	07
එකතුව	311

සප්ත මෛථුනය

බ්‍රහ්මචරිය සීලය කිලිටි කරන සප්ත මෛථුනය:

1. ස්ත්‍රීන් විසින් කරන නෑවීම, ඇඟ ඉලීම, අත් පා පිරිමැදීම යනාදිය පිළිගැනීම හා ඒවායේ මිහිරි විඳීම, ඒවාට කැමති වීම.
2. ස්ත්‍රීන් හා කවටකම් කිරීම, ක්‍රීඩා කිරීම, ඔවුන්ගේ ඇඟේ හැපීම, ඔවුන්ගේ ශරීරය පිරිමැදීම, ඔවුන් හා සිනාසීම යන මේවායේ රස විඳීම, සතුටු වීම.
3. ස්ත්‍රීන්ගේ රූපශෝභාව බලමින් මේ මේ තැන මෙසේ මෙසේ ලස්සනය හොඳය යි සිතමින් රස විඳීම.
4. සීත්‍රීන්ගේ හඬ අසමින් රස විඳීම.
5. පෙර ස්ත්‍රීන් හා කළ කෙළි සිනා ආදිය සිහි කරමින් ඒවායේ රස විඳීම.
6. පස්කම් සැප විඳින අන්‍යයන්ගේ සම්පත් බලා සතුටු වීම.
7. රක්නා වූ මේ සීලයේ බලයෙන් දෙවියෙක් වෙම්වායි අනාගතයෙහි ලබන්නට ඇති ඒ දිව්‍ය සම්පත්තිය සිතින් විඳීම, ඒ ගැන සතුටු වීම.

අරියකාන්ත සීලය

අඛණ්ඩ	මුලින් හෝ අගින් සිල්පද නො කඩා රැකීම.
අච්ඡිද්ද	මැදින් සිල් පද නො කඩා රැකීම.
අසබල	මුල මැද අග සිල් පද නො කඩා රැකීම.
අකම්මාස	අතර අතර එකදු සිල් පදයක් හෝ නො කඩා රැකීම.
භුජිස්ස	භුජිස්ස යනු "නිදහස්" යන්නයි. මෙතැන දී නිදහස් කියා කියනු ලබන්නේ, තණ්හා දාස භාවයෙන් නිදහස් වූ යන්නයි.
විඤ්ඤුප්පසත්ථ	නුවණැත්තන් හා පැවිදි උතුමන්ගේ ප්‍රශංසාවට ලක්වන පරිදි සිල් රැකීම.
අපරාමට්ඨ	ලාභ කීර්ති අපේක්ෂාවෙන් තොරව සිල් රැකීම.
සමාධි සංවත්තනික	සිතේ සමාධිය ඇති වන පරිදි සිල් රැකීම.

පින් අනුමෝදනාව-මෙම රූප සටහන සකස් කිරීම සඳහා රේරුකානේ චන්දවිමල නායක ස්වාමීන්වහන්සේ ගේ පාරමිතා ප්‍රකරණය, බෞද්ධයාගේ අත්පොත පරිශීලනය කළෙමි. එමෙන්ම මාන්කඩවල සුදස්සන හිමියන්ගේත් කිරිබත්ගොඩ ඤාණානන්ද හිමියන්ගේත් සීලය මූලාශ්‍ර කරගෙන කරන ලද ධර්ම දේශනා ශ්‍රවණය කළෙමි. එමෙන්ම මීට කලකට ඉහත සමින්ද රණසිංහ මහතා විසින් ඉරුදින යුරෝපයේ කල්‍යාණ මිත්‍රයන් වෙනුවෙන් කරන ලද සීලය සම්බන්දව කරනු ලැබූ ධර්ම සාකච්ඡාවද මහගු උපකාරයක් විය. එමනිසා ඒ සැමදෙනාටම මෙම කුසල බලයෙන් නිර්වාණ අවබෝධය පතනෙමු. එමෙන්ම මා හට ආර්ය සීලයෙහි ඇති වටිනාකම කියා දීමටත් ඒ වෙත යොමුකිරීමට කරුණු කියා දුන් චන්දිමා මහත්මියටත්, මෙහි සෑම අකුරක් හා අර්ථයක් පාසා නිවැරදි කර මේ අයුරින් ඔබ වෙත තිලිණ කිරීමට පසුපසින් සිට නොමසුරුව සහයෝගය දෙන මාගේ කල්‍යාණ මිත්‍ර ජයන්ත රත්නායක මහතාටත්, ඕස්ට්‍රේලියාවේ ඇඩිලෙයිඩ් නුවර වැඩ වසන උඩගබ්බල ඥාණාලෝක හිමියන්ටත්, ලලිත් දළුවත්ත මහතාටත්, මගේ දයාබර බිරිඳටත් වහ වහා නිර්වාණය අවබෝධ වීමට මෙම කුසල කර්මය හේතුවේවා යයි පතන අතර මලිත් පුතුට නිරෝගී සුවයද පතන්නෙමි. 14-09-2014

වත්ථූපම සූත්‍රය

සිත කිලුටු කරන්නාවූ ද, දුගතිය කරා රැගෙන යන්නාවූ ද, නිවන් මග යන්නවුන් විසින් දුරුකළයුතු වූ ද කරුණු දහසය

මජ්ඣිම නිකාය - මූලපරියාය වර්ග පිටු අංක 83-91 PDF 102 - 110



මධුපිණ්ඩික සුත්‍රය

මජ්ඣිම නිකාය - මුල පණ්නාසකය බුද්ධ ජයන්ති ත්‍රිපිටකය පිටු අංක 272-287
භාග්‍යවතුන් වහන්සේගේ උද්දේස (කෙටි) දේසනාව.
මහා කච්චායන මහරහතන් වහන්සේගේ නිද්දේස (විස්තරාත්මක) දේසනාව.



"පින්වත් භික්ෂුව, යම් කරුණක් මුල්කරගෙන ඉහතින් සඳහන් සත් ආකාර ක්ලේශ අනුසයන් සාදන්නා වූ සඤ්ඤා සිත තුල ඇතිවේද, එය පිළිනොගන්නා බවත්
එහි බැස නොගන්නා බවත්, එහි ගුණ නොකියනා බවත්මය මෙම අනුස ධර්මයන්ගේ අවසානය.
මෙයමයි දඬු මුගුරු අරගැනීමේ, අවි ආයුධ අරගැනීමේ, කෝලාහල කරගැනීමේ, වාද විවාද කර ගැනීමේ,
කේලාම් කීමේ, බොරු කීමේ අවසානවීම. පාපී සියලු අකුසල් ඉතිරි නැතිව නිරුද්ධ වන තැන." යැයි
භාග්‍යවතුන් වහන්සේ මහත් වූ කරුණාවෙන් වදාළ සේක.

මෙම ධර්ම දානයේ යම් කුසලකර්මයක් වේද එය මලිත් පුතුට නීරෝගී සුව පිණිසම වේවා!!
28-02-2014

සමාධි භාවනා සූත්‍රය

සංයුත්තනිකාය 3 - බු.ජ. ත්‍රිපිටකය පිටු අංක 22-25

දේශිත ස්ථානය : සැවැත්නුවර ජේතවනාරාමය

"මහණෙනි, සමාධිය වඩව්, මහණෙනි සමාධිගත මහණ යථාභූතව - ඇති සැටි නුවණින් දනී කුමක් යථාවයෙන් නුවණින් දනී ද යත්: රූපයාගේ සමුදය (හටගැනීම) ද අස්තගමය (අභාවය හෙවත් හට නොගැනීම) ද, වේදනාවේ සමුදය ද, අස්තමය ද, සංඥාවේ සමුදය ද, අස්තගමය ද, සංස්කාරයන්ගේ සමුදය ද, අස්තමය ද, විඥානයාගේ සමුදය ද, අස්තගමය ද, නුවණින් දනී"
(එනම් පංච උපාදානස්කන්ධයේ ම සමුදය ද අස්තගමය ද නුවණින් දනී).

දුක

සමුදය

නිරෝධය

මාර්ගය

පංච උපාදානස්කන්ධයේ සමුදය

පංච උපාදානස්කන්ධය

පංච උපාදානස්කන්ධයේ අස්තගමය

2.වේදනා උපාදානස්කන්ධය

3. සංඥා උපාදානස්කන්ධය

4. සංඛාර උපාදානස්කන්ධය

1. රූප උපාදානස්කන්ධය

දැඩිව ග්‍රහණය වනු ලබන අර්ථයෙන් උපාදාන නම් වේ

5. විඥාන උපාදානස්කන්ධය

"අතීත, අනාගත, වර්තමාන, ආධ්‍යාත්මික, බාහිර, හීන, ප්‍රණීත, ඕලාරික (රළු), සුඛුම (සියුම්), දුර, ලඟ," යන එකොළොස් අර්ථයෙන් ස්කන්ධ නම් වේ.

අභිනන්දති, අභිවදති, අජ්ඣෝසාය තිට්ඨති

මහණෙනි මෙම සස්නෙහි මහණ පතයි, ලෝභ වශයෙන් මැනැවැයි කියයි, එහි බැසගෙන සිටී.

කුමක් පතයිද, මැනැවැයි කියයිද, එහි බැසගනීද

අභිනන්දති

අභිවදති

අජ්ඣෝසාය තිට්ඨති

රූපය පතයි. මැනැවැයි කියයි. එහි බැසගනී

වේදනාව පතයි. මැනැවැයි කියයි. එහි බැසගනී

සංඥාව පතයි. ගුණ කියයි. එහි බැසගනී

සංස්කාරය පතයි මැනැවැයි කියයි. එහි බැසගනී

විඥාණය පතයි මැනැවැයි කියයි. එහි බැසගනී

එබැවින් ඔහුට ඒ කෙරෙහි තෘෂ්ණාව උපදී.

එහි යම් තෘෂ්ණාවක් වේ නම් ඒ උපාදනයයි.

උපාදාන ප්‍රත්‍යයෙන් භවය වේ.

භව ප්‍රත්‍යයෙන් ජාතිය වේ.

ජාති ප්‍රත්‍යයෙන් ජරා මරණ ශෝක පරිදේව දුක්ඛ දෝමනස්ස උපායාසයෝ හටගනිත්. මෙසේ මේ හුදු දුක් රැසෙහි සමුදය වේ.

සංසාරය

නාභිනන්දති, නාභිවදති, නාජ්ඣෝසාය තිට්ඨති

මහණෙනි මෙම සස්නෙහි මහණ නොපතයි, ලෝභ වශයෙන් මැනැවැයි නො කියයි, එහි බැසනොගනී.

කුමක් නොපතයි ද, මැනැවැයි නො කියයි ද, එහි බැසනොගනී ද

නාභිනන්දති

නාභිවදති

නාජ්ඣෝසාය තිට්ඨති

රූපය නො පතයි, මැනැවැයි නොකියයි, එහි බැසනොගනී

වේදනාව නො පතයි, මැනැවැයි නොකියයි, එහි බැසනොගනී

සංඥාව නො පතයි, මැනැවැයි නොකියයි, එහි බැසනොගනී

සංස්කාරය නො පතයි, මැනැවැයි නොකියයි, එහි බැසනොගනී

විඥානය නො පතයි, මැනැවැයි නොකියයි, එහි බැසනොගනී

එබැවින් ඔහුට ඒ කෙරෙහි තෘෂ්ණාව නිරුද්ධ වේ.

තෘෂ්ණා නිරෝධයෙන් උපාදාන නිරෝධය වේ.

උපාදාන නිරෝධයෙන් භව නිරෝධය වේ.

භව නිරෝධයෙන් ජාති නිරෝධය වේ.

ජාති නිරෝධයෙන් ජරා මරණ ශෝක පරිදේව දුක්ඛ දෝමනස්ස උපායාසයෝ නිරුද්ධ වෙති. මෙසේ මේ හුදු දුක් රැසෙහි නිරෝධය වේ.

මහණෙනි මෙයි රූපයේ නිරෝධය යි, වේදනාවේ නිරෝධය යි, සංඥාවේහි නිරෝධය යි, සංස්කාරයෙහි නිරෝධය යි, විඥානයෙහි නිරෝධය යි

නිර්වාණය

පුණ්‍යානුමෝදනාව සහ විශේෂ ස්තූතිය : ජයන්ත රත්නායක මහතාට, මෙය අන්තර්ජාලය තුළින් හා මුද්‍රණය කොට බෙදා හරින ඔබ සැමට හා මාගේ බිරිඳට. - මලිත් පුතුට නිරෝගී සුව !! -
E-mail: kalanaworld@gmail.com Skype : kalanamithuro 19.09.2014

සම්මාදිට්ඨි සූත්‍රය

මජ්ඣිම නිකාය - මූල පණ්නාසකය මුද්‍රිත අංක පිටුව 130 ධර්ම සේනාධිපති සැරියුත් මහ රහතන් වහන්සේ විසින් ජේතවනාරාමයේදී භික්ෂු සංඝයා අමතා, යමකු සම්මාදිට්ඨියට පැමිණීමේ විවිධ ආකාරයන් පිළිබඳව, කරනු ලැබූ අති ගාම්භීර දේශනාව



මේ ආකාරයෙන් වූ කරුණු දහසයෙන් එකදු කරුණක් හෝ ආර්යශ්‍රාවකයකු හෝ ආර්යශ්‍රාවිකාවක හෝ විසින් නුවණින් පිරිසිඳ දකිනු ලබන්නේ නම් එතෙකින්ම හෙතෙම සම්මාදිට්ඨියට පැමිණියේ වේ. ඔහුගේ / ඇයගේ දෘෂ්ඨිය සෘජුවූයේ වේ. දහමෙහි ගුණ දැන පැහැදුනේ වේ. සද්ධර්මයට හෙවත් ආර්ය අෂ්ඨාංගික මාර්ගයට පැමිණියේ වේ. එනම් සෝතාපන්න වූයේ වේ.

www.kalanamithuro.com
E-mail - thusitha@free.fr
Facebook-Kalanaworld
Skype - Kalanamithuro

විශේෂ ස්තූතිය ජයන්ත රත්නායක මහතාට
ධර්මදානය මලිත් පුතුට නිරෝගි සුව පිණිස.....
14-04-2014

අවිජ්ජා සූත්‍රය

අවිද්‍යාවට හා විද්‍යා විමුක්තියට හේතුවන කරුණු - අංගුත්තර නිකාය සයවෙනි කාණ්ඩය පිටු අංකය 205 PDF පිටු අංකය 232

අවිද්‍යාව	චතුරාර්‍ය සත්‍යය අවබෝධ නොවීම
පංච නීවරණ	කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්දච්ච කුක්කුච්ච, විචිකිච්ඡා
ත්‍රිවිධ දුශ්චරිතය	කාය දුශ්චරිත, වචී දුශ්චරිත, මනෝදුශ්චරිත (අභිධ්‍යා, ව්‍යාපාද, මිත්‍යාදෘෂ්ඨි)
ඉන්ද්‍රිය අසංවරය	ඇසෙන් රූප දැක හෝ, කනින් ශබ්ද අසා හෝ, නාසයෙන් ගඳ සුවඳ විඳ හෝ, දිවෙන් රසයක් විඳ හෝ, මනසෙන් අරමුණු ගෙන හෝ, ඇලීම් ගැටීම් ඇතිවන සේ නිමිති ගැනීම.
අසති අසම්පජඤ්ඤය	අසිහියෙන්, නුනුවණින් කටයුතු කිරීම
අයෝනිසෝමනසිකාරය	නූපන් කෙළෙස් උපදින ලෙස ද, උපන් කෙළෙස් වැඩි දියුණු වන ලෙස ද යමක් කෙරෙහි මෙනෙහි කිරීම.
අශ්‍රද්ධාව	බුදුරජාණන් වහන්සේගේ අවබෝධය පිළිබඳව විස්වාසයක් නොමැතිකම.
අසද්ධර්ම ශ්‍රවණය	අසත්පුරුෂයන්ගේ වදන් අසා එලෙස පිළිපැදීමට යාම
අසත්පුරුෂ සේවනය	ප්‍රඥාවේ අලෝකයෙන් ඈත් කරන අවිද්‍යා අඳුර කරා ගෙනයන කල්පාන්තරයක් නිරයේ දුක්විඳීමට මග සකසා දෙන අසත්පුරුෂ සේවනය

- විද්‍යා විමුක්ති
- සප්ත බොජ්ඣඞ්ග
  - සති
  - ධම්මවිචය
  - විරිය
  - ප්‍රීති
  - පස්සද්ධි
  - සමාධි
  - උපේක්ඛා
- සතර සතිපට්ඨානය
- ත්‍රිවිධ සුචරිතය
- ඉන්ද්‍රිය සංවරය
- සතිසම්පජඤ්ඤය
- යෝනිසෝමනසිකාරය
- ශ්‍රද්ධාව
- සද්ධර්මශ්‍රවණය
- සත්පුරුෂ සේවනය

1. අසත්පුරුෂ (වි.සත්පුරුෂ) ත්‍රිවිධ දුෂ්චරිතයන්හි යෙදෙන්නා.
2 අසත්පුරුෂ තර (වි. සත්පුරිෂ තර) තමන් ත්‍රිවිධ දුෂ්චරිතයන්හි යෙදෙමින් අනුන්වත් එහි යොදවන්නා.
** සත්පුරුෂයා යන්න බුදුරජාණන් වහන්සේ අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ සප්පුරිස වර්ගයේ සප්පුරිස සූත්‍ර සයක විවිධාකාරයෙන් සවිස්තරව දක්වා ඇත.**

"මහණෙනි, කඳු මුදුනට වැසි වසිනා කල්හි එම දිය එහි ඇති කුඩා වල ගැට්ති පුරාලයි ද, ඒවා පිරී ගොස් ඊට වඩා ලොකු වලවල් පිරේ ද, ඒවා පිරී ගොස් කුඩා දිය කඩිති සාදයි ද, ඒ දිය කඩිති එක් වී කුඩා දිය පහරවල් සාදයි ද, ඒ කුඩා දිය පහරවල් මහා ගංගා ජලය හා එක්වෙයි ද, ඒ ගංගා ජලය මහා සාගරය හා එක්වෙන්නාක්මෙන්, අසත්පුරුෂ සේවනයත් අසද්ධර්ම ශ්‍රවනයත්, අශ්‍රද්ධාවත්, අයොනිසෝමනසිකාරයත්, අසති අසම්පජඤ්ඤයත්, ඉන්ද්‍රිය අසංවරයත්, ත්‍රිවිධ දුශ්චරිතයත්, පංච නීවරණයත්, අවසානයේ අවිද්‍යාව නම් වූ තෙරක් නොපෙනෙන රුදුරු සයුර කරා අවිද්‍යා සහගත පුද්ගලයාව රැගෙනයයි" යනුවෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනාකොට වදාරණ ලදී.

2014.03.03

විශේෂ ස්තුතිය ජයන්ත රත්නායක මහතාට ධර්මදානය මලිත් පුතුට නිරෝගි සුව පිණිස.....

සබ්බාසව සූත්‍රය

මජ්ඣිම නිකාය - මූල පණ්ණාසකය පිටු අංක 18-28 සම්මා සම්බුදු ලොව්තුරා බුදුපියාණන් වහන්සේ විසින් සැවත් නුවර ජේතවනයේදී සියලු ආශ්‍රවයන් හා ආශ්‍රවක්ෂය ගැන වදාළ සූත්‍ර දේශනාව

සියලු ආශ්‍රවයන් ක්ෂය කිරීම

ආශ්‍රව දුරු කළ හැක්කේ කා හටද?

දන්න කෙනාටත් දකින කෙනාටත් ආශ්‍රවක්ෂය වේ.

කුමක් දන්නා කුමක් දක්නා කෙනකු හටද?

යෝනිසෝ මනසිකාරයත් අයෝනිසෝ මනසිකාරයත් දන්නා දක්නා කෙනකු හට

යෝනිසෝ මනසිකාරය යනු කුමක්ද?

යමක් මෙනෙහි කිරීමේදි නූපන්නාවූ කාම ආශ්‍රව, භව ආශ්‍රව අවිද්‍යා ආශ්‍රව නූපදිනම් උපන්නා වූ කාම ආශ්‍රව, භව ආශ්‍රව, අවිද්‍යා ආශ්‍රව දුරුවේ නම් එසේ මෙනෙහි කිරීම යෝනිසෝ මනසිකාරය වේ.

අයෝනිසෝ මනසිකාරය යනු කුමක්ද?

යමක් මෙනෙහි කිරීමේදි නූපන්නාවූ කාම ආශ්‍රව, භව ආශ්‍රව, අවිද්‍යා ආශ්‍රව උපදීනම් උපන්නා වූ කාම ආශ්‍රව, භව ආශ්‍රව අවිද්‍යා ආශ්‍රව වැඩේ නම් එසේ මෙනෙහි කිරීම අයෝනිසෝ මනසිකාරය නම් වේ.

ආශ්‍රවයෝ යනු කරහුද? ප්‍රහාණය කළ හැක්කේ කෙසේද?

දිට්ඨාශ්‍රව පිළිබඳ මෙම සූත්‍රයේ විශේෂයෙන් සඳහන් කොට නොමැති බවත් මෙය කියවන ඔබගේ අවබෝධය සඳහා එය මෙහි සඳහන් කළ බවත් කරුණාවෙන් සළකන්න.

ආශ්‍රවයන්

දිට්ඨාශ්‍රව | කාමාශ්‍රව | භවාශ්‍රව | අවිජ්ජාශ්‍රව

දිට්ඨි ආශ්‍රවය පමණක් සෝවාන් මගඵලින් මුළුමණින් ප්‍රහාණය වේ

ප්‍රහාණය කළ හැකි ආකාර

1 දර්ශනයෙන්

මේ සඳහා සත්පුරුෂයන් ඇසුරද සද්ධර්මශ්‍රවනයද අවශ්‍යවේ.

බුද්ධාදි ආර්යයන් නො දක්නා වූ ආර්යධර්මයෙහි අදක්ෂ වූ ආර්යධර්මයෙහි නො හික්මුණාවූ බුද්ධාදී සත්පුරුෂයන් නොදන්නා වූ නොදක්නාවූ සත්පුරුෂ ධර්මයේ නොහික්මුණු අදක්ෂ අන්ධ බාල පෘථජ්ජන තෙමේ මෙනෙහි කළයුත්ත කුමක්ද මෙනෙහි නොකළ යුත්ත කුමක්දැයි නොදනී. එමනිසා මිත්‍යා දෘෂ්ඨිනට පහසුවෙන් ගොදුරු වේ. සිහිනොකළ යුත්ත සිහි කරයි. සිහිකළ යුත්ත සිහි නොකරයි. මෙය හේතුකොටගෙන ඇතිවන අයොනිසෝ මනසිකාරය නිසා ආශ්‍රවයන් ඉපිද වැඩීමට යේ. ආර්යයන් සහ සත්පුරුෂයින් ගුණ වශයෙන් හඳුනන එම ධර්මයන්හි හික්මෙන ශ්‍රුතවත් ආර්ය ශ්‍රවකයකු විසින් යෝනිසෝමනසිකාරයෙහි යෙදීමෙන් නූපන් ආශ්‍රවයන්ගේ නූපදීම ද උපන් ආශ්‍රවයන්ගේ ප්‍රහාණය ද වේ.

ශ්‍රුතවත් ආර්ය ශ්‍රාවකයා යනුවෙන් මෙහි විරුද්ධාර්ථය ගන්න.

මෙසේ නුනුවණින් මෙනෙහි කරණ ඔහුට සවැදෑරුම් දෘෂ්ටීන් අතුරෙන් එක්තරා දෘෂ්ටියෙක් උපදී.

1. සත්‍ය වශයෙන් ස්ථිර වශයෙන් ආත්මයක් ඇත. (ශාශ්වත දෘෂ්ටිය)
2. සත්‍යවශයෙන් ස්ථිරවශයෙන් ආත්මයක් නැත. (උච්ඡේද දෘෂ්ටිය)
3. ආත්මීය වූ මම ආත්මය හඳුනමි
4. ආත්මීය වූ මම අනාත්මය හඳුනමි
5. අනාත්ම වූ මම ආත්මය හඳුනමි
6. කුසලා කුසල කර්ම විපාක අනුව සැපදුක් විඳින මාගේ ආත්මය නිත්‍ය යයි යන දෘෂ්ටිය

මහණෙනි, මෙය දෘෂ්ටිගතයක් යැයි ද, දෘෂ්ටිග්‍රහණයක් යැයි ද, දෘෂ්ටිකාන්තාරයක් යැයි ද, (සම්මා දිට්ඨිය විනිවිදිනා හෙයින්) දෘෂ්ටිවිශුකයක් යැයි ද, දෘෂ්ඨි කම්පනයක් යැයි ද, දෘෂ්ටිසංයෝජනයක් යැයි ද කියනු ලැබේ. මහණෙනි, දෘෂ්ටිසංයෝජනයෙන් සංයුක්ත වූ ආශ්‍රුතවත් පෘතග්ජන තෙම ජාතියෙන්, ජරාවෙන්, මරණයෙන්, ශෝකයෙන්, වැලපීමෙන්, කායික දුකින්, මානසික දුකින්, දැඩි ආයාසයෙන් නො මිදේ. සියලු දුකින් නො මිදේ යැයි කියමි.

2 සංවරයෙන්

ෂඩ් ආයතනයන්හි සංවරයෙන් ප්‍රහාණය කළ යුතු ආශ්‍රව

මහණෙනි, මේ සස්නෙහි මහණ තෙමේ නුවණින් සළකා ඇස, කණ, නාසය, දිව, කය, මනස නමැති ආයතන සංවර කරගැනීමෙන් පීඩාකාරී දැවිලි ඇතිවන ආශ්‍රවයන් දුරු කරයි.

3 ප්‍රත්‍යවේක්ෂාඥානයෙන්

භාවිතයේදී නුවණින් සලකා ප්‍රහාණය කළ යුතු ආශ්‍රව

මේ ශාසනයෙහි මහණ තෙමේ නුවණින් සලකා හුදෙක් ශීත නැති කිරීම පිණිස, උෂ්ණ නැති කිරීම පිණිස, මැසි මදුරු අවු සුළං, සර්පයින් හා ස්පර්ශ නැති කිරීම පිණිස, ලජ්ජාස්ථාන වසා ගැන්ම පිණිස නුවණින් සිවුරු පරිභෝග කෙරෙ යි, නුවණින් සලකා පිණ්ඩපාතය වළඳයි. (එය) ක්‍රීඩා පිණිස නොවේම ය. මදය පිණිස නොවේම ය. සැරසීම පිණිස නොවේම ය. අලංකාර පිණිස නොවේම ය. හුදෙක් මේ ශරීරයාගේ පැවැත්ම පිණිස ම ය. යැපීම පිණිස ම ය. බඩගිනි වැළැක්වීම පිණිස ම ය. බ්‍රහ්මචරියාවට අනුග්‍රහය සඳහා ම යැයි නුවණින් සළකා සිවුපසය පරිභෝගය ඇසුරු කොට හටගත හැකි දැවිලි සහිත ආශ්‍රව ධර්මයන් දුරු කරයි.

4 අධිවාසනයෙන් (ඉවසීමෙන්)

ඉවසීමෙන් ප්‍රහාණය කළ යුතු ආශ්‍රව

මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ නුවණින් සළකා ශීත ඉවසන සුළු වෙයි. උණුසුම ද, බඩගින්න ද, පිපාසය ද, මැසි, මදුරු, සුළං, අව්ව, සර්පයින් හා ස්පර්ශ ද, නපුරු කොට කියූ, නපුරු ලෙස පැමිණි වචන ද ඉවසන සුළු වෙයි. උපන් ශාරීරික වූ, තියුණු වූ රළු වූ කටුක වූ අමිහිරි වූ අමනාප වූ දිවි පැහැර ගන්නා වූ වේදනා ඉවසන සුළු වෙයි. යම් හෙයෙකින් නො ඉවසන සුළු වූ කල වෙහෙසකර දැවිලි සහිත ආශ්‍රවයෝ උපදිත් ද, මෙසේ ඉවසන කල වෙහෙසකර දැවිලි සහිත ආශ්‍රවයෝ නූපදිත්.

5 පරිවර්ජනයෙන් (මගහැරීමෙන්)

නුවණින් යුතුව මග හැරීමෙන් ප්‍රහාණය කළ යුතු ආශ්‍රව

මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ නුවණින් සලකා නපුරු ඇතුන් මග හරියි. නපුරු අශ්වයන් මග හරියි. නපුරු ගොනුන් මග හරියි. නපුරු සුනඛයින් මග හරියි. සර්පයින්, උල් කණු, කටුලැහැබ, නපුරු බෑවුම්, පර්වත, ගවරවල, කුණු වල ආදිය මග හරියි.යම් බඳු නුසුදුසු අසුනෙහි හුන්නහු ද, යම්බඳු නුසුදුසු තන්හි හැසිරෙන්නහු ද, යම්බඳු පව්ටු මිතුරන් සේවනය කරන්නහු ද, නුවණැත්තා වූ සබ්‍රම්සර හු ලාමක තන්හි ලා සලකන්නා හු ද, ඒ තෙමේ ඒ නොඅසුන ද, ඒ අගෝචරය ද ඒ පාපමිත්‍රයන් ද නුවණින් සළකා මග හරියි. මහණෙනි, යම් හෙයෙකින් එබඳු දේ මග නොහරින්නේ නම් වෙහෙස හා දැවිලි සහිත ආශ්‍රවයෝ උපදිත් ද, මෙසේ එබඳු දේ දුරු කරන්නහුට වෙහෙස හා දැවිලි සහිත ආශ්‍රවයෝ නො වෙත්.

6 විනෝදනයෙන් (දැඩි වීර්යයෙන්)

අකුසල සිතිවිලි දුරුකිරීමෙන් ප්‍රහාණය කළ යුතු ආශ්‍රව

මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ නුවණින් සලකා උපන් කාමවිතර්කය නොඉවසයි. (සිත තබා නොගනියි). දුරු කරයි, බැහැර කරයි, විනාශ කරයි. නැවත නො ඉපදීමට පමුණුව යි. උපන්නා වූ ව්‍යාපාද විතර්ක නොඉවසයි. දුරු කරයි, බැහැර කරයි, විනාශ කරයි, නැවත නො ඉපදීමට පමුණුවයි. උපන්නා වූ විහිංසා විතර්කය උපනූපන් ලාමක අකුශල ධර්මයන් සිත තබා නො ගනියි, දුරු කරයි, බැහැර කරයි, විනාශ කරයි, නැවත නො ඉපදීමට පමුණුවයි. මහණෙනි, යම් හෙයකින් එබඳු දේ දුරු නො කරන්නා වූ ඔහුට වෙහෙස හා දැවිලි සහිත ආශ්‍රවයෝ උපදිත් ද, මෙසේ එබඳු දේ දුරු කරන්නහුට වෙහෙස හා දැවිලි සහිත ආශ්‍රවයෝ නො වෙත්.

7 භාවනාවෙන්

(සමථ - විදර්ශනා) භාවනාවෙන් ප්‍රහාණය කළ යුතු ආශ්‍රව

මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ නුවණින් සලකා විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවණට නැඹුරු සතිසම්බොජ්ඣඞ්ගය වඩයි. නුවණින් සලකා විවේකය ඇසුරු කළ.... ධම්මවිචය සම්බොජ්ඣඞ්ගය වඩයි. එසේම විරියසම්බොජ්ඣඞ්ගය වඩයි. එසේම පිතිසම්බොජ්ඣඞ්ගය වඩයි. එසේම පස්සද්ධි සම්බොජ්ඣඞ්ගය වඩයි. එසේම සමාධිසම්බොජ්ඣඞ්ගය වඩයි. විවේකය ඇසුරු කළ... උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය වඩයි. මහණෙනි, යම් හෙයෙකින් බොජ්ඣඞ්ග නොවඩන්නාට වෙහෙස හා දැවිලි සහිත ආශ්‍රවයෝ උපදිත් ද, මහණෙනි, මෙසේ ඒ බොජ්ඣඞ්ග වඩන්නා වූ ඔහුට ඒ වෙහෙස දැවිලි සහිත ආශ්‍රවයෝ නොවෙත්.

"මහණෙනි, යම් භික්ෂුවක් මෙම ආශ්‍රව නුවණින් සළකා ප්‍රහාණය කළේ ද, එම භික්ෂුව සියලු ආශ්‍රවයන්ගෙන් සංවෘතව වෙසේ ය යි ද, තෘෂ්ණාව සින්දේ ය යි ද, සංයෝජනයන් උපුටා හළේ යයි ද, මානප්‍රහාණයෙන් දුක් කෙළවර කළේ යයි ද කියනු ලැබේ" යැයි අප භාග්‍යවතුන් වහන්සේ මහත් වූ කරුණාවෙන් වදාළ සේක.

පුණ්‍යානුමෝදනාව සහ විශේෂ ස්තූතිය : සුමධුර ධර්ම දේශනා තුලින් මෙම දහම් කරුණු මතු කරදුන් අති පූජ්‍ය මාංකඩවල සුදස්සන හිමිපාණන්හට ද, අති පූජ්‍ය පිටිගල ගුණරතන හිමිපාණන්හට ද, මෙම රූ සටහන් සැකසීම සඳහා නොමසුරු සහයෝගය ලබාදෙන මාගේ කල්‍යාණ මිත්‍ර ජයන්ත රත්නායක මහතාට හා ඉතා ඉවසීමෙන් යුතුව මෙවන් කාර්යයන් සඳහා මසුපසින් සිට මා දිරිගන්වන්නා වූ මාගේ දයාබර බිරිඳට, මේ පින් බලයෙන් වහ වහා නිර්වාණය අවබෝධ වේවා යි මහත් වූ මෛත්‍රිය පෙරදැරිව පතනෙමි. ධර්ම දානය මලිත් පුතුට නිරෝගී සුව පිණිස.

www.kalanamithuro.com Skype - Kalanamithuro - Facebook-Kalanaworld - E-mail - thusitha@free.fr - France 14-06-2014

මහාසළායතනික සූත්‍රය - මජ්ඣිම නිකාය 3

සැවැත්නුවර අනාථපිණ්ඩික සිටු තුමා විසින් කරවනලද ජේතවනාරාමයේ දී
ලොවුතුරා බුදු රජාණන් වහන්සේ විසින් භික්ෂු සංඝයා අරඹයා දේසනා කරන ලද්දකි.

දුක | සමුදය

අජානං අපස්සං යථාභූතං

ඒ ඒ ආයතනයන්, ගෝචර අරමුණු, අරමුණු දැන ගන්නා සිත් හා ඒ ඒ ආයතනයන්හි ස්පර්ශය යථාභූතව එනම් ඇත්ත ඇති සැටියෙන් නොදන්නා නොදක්නා කෙනා (අජානං අපස්සං යථාභූතං) ඒ ඒ තැන්වල හටගන්නා සැපක් හෝ දුකක් හෝ උපේක්ෂා විඳීමක් හෝ ඇද්ද, එමනිසා එම ආයතනයන්ගේත් එහි ගෝචර රූපයන්ගේත් එම විඤ්ඤාණයේත් ස්පර්ශයේත් ඇලී මුලා වී ආශ්වාදය අනුව දකිමින් වාසය කරයි. එසේ කරන ඔහුගේ පංච උපාදානස්කන්ධය රැස්වීමට යෙයි. එමගින් පුනර්භවය ඇතිකරන නන්දිරාගයෙන් යුක්තවූ ඒ ඒ තැන සතුටින් පිළිගන්නා යම් තණ්හාවක් ඇද්ද එය ඔහු තුල වැඩේ. සිත හා සිතිවිලි (දරථ) රළු ඕලාරික වේ.
එමගින් කායික මානසික සංතාප දැවිලි ඇතිවේ.

ආයතන	ගෝචර රූප	විඤ්ඤාණය	ස්පර්ශය
ඇස (චක්ඛු)	රූපය	ඇසෙහි විඤ්ඤාණය	ඇසෙහි ස්පර්ශය
කණ (සෝත)	ශබ්දය	කණෙහි විඤ්ඤාණය	කණෙහි ස්පර්ශය
නාසය (ඝාණ)	ගඳ සුවඳ	නාසයෙහි විඤ්ඤාණය	නාසයෙහි ස්පර්ශය
දිව (ජිව්හා)	රස	දිවෙහි විඤ්ඤාණය	දිවෙහි ස්පර්ශය
කය (කාය)	පහස	කයෙහි විඤ්ඤාණය	කයෙහි ස්පර්ශය
මනස (මනෝ)	අරමුණු	මනසේ විඤ්ඤාණය	මනසෙහි ස්පර්ශය

නිරෝධය | මාර්ගය

ඡානං පස්සං යථාභූතං

ඒ ඒ ආයතනයන්, ගෝචර අරමුණු, අරමුණු දැන ගන්නා සිත් හා ඒ ඒ ආයතනයන්හි ස්පර්ශය යථාභූතව එනම් ඇත්ත ඇති සැටියෙන් දන්නා දක්නා කෙනා (ජානං පස්සං යථාභූතං)
ඒ ඒ තැන්වල හටගන්නා සැපක් හෝ දුකක් හෝ උපේක්ෂා විඳීමක් හෝ ඇද්ද, එමනිසා එම ආයතනයන්ගේත් එහි ගෝචර රූපයන්ගේත් එම විඤ්ඤාණයේත් ස්පර්ශයේත් නොඇලී මුලා නොවී ආදීනව දකිමින් වාසය කරයි. එසේ කරන ඔහුගේ පංච උපාදානස්කන්ධය ක්ෂයවීමට යෙයි. එමගින් පුනර්භවය ඇතිකරන නන්දිරාගයෙන් යුක්තවූ ඒ ඒ තැන සතුටින් පිළිගන්නා යම් තණ්හාවක් ඇද්ද එය ප්‍රහීණ වෙයි. දරථයෝ ප්‍රහීණ වෙති. කායික මානසික සංතාප දැවිලි ප්‍රහීණ වෙයි.

සත්තිස් බෝධිපාක්ෂික ධර්ම වැඩීම

එසේ ආර්ය අෂ්ඨාංගික මාර්ගය වඩනා ඔහුට
සතර සතිපට්ඨානය ද භාවනායෙන් පිරීමට යේ.
සතර සම්‍යක් ප්‍රධානයන් ද වැඩීමෙන් පිරීමට යේ.
සතර ඉර්ධිපාදයන් ද වැඩීමෙන් පිරීමට යේ.
පඤ්ච ඉන්ද්‍රියන් ද වැඩීමෙන් පිරීමට යේ.
පඤ්ච බලයන් ද වැඩීමෙන් පිරීමට යේ.
සප්ත බොජ්ඣංගයන් ද වැඩීමෙන් පිරීමට යේ.

ආර්ය අෂ්ඨාංගික මාර්ගය වැඩීම

එබඳු වූ කෙනාගේ යම් දෘෂ්ඨියක් ඇත්ද එය ඔහුට සම්මාදිට්ඨිය වේ.
යම් සංකල්පයක් ඇත්ද එය ඔහුට සම්මාසංකල්පය වේ.
යම් වායාමයක් ඇත්ද එය ඔහුට සම්මාවායමය වේ.
යම් සතියක් ඇත්ද එය ඔහුට සම්මාසතිය වේ.
යම් සමාධියක් ඇත්ද එය ඔහුට සම්මාසමාධිය වේ
ඔහුගේ කාය කර්මය ද ව චී කර්මය ද ආජීවය ද පිරිසිදු වේ.
මෙසේ ඔහුට ආර්ය අෂ්ඨාංගික මාර්ගය භාවනායෙන් වැඩීමට යේ.

සමථ විදර්ශනා යුගනද්ධව වැඩීම හා විද්‍යා විමුක්තිය සාක්ෂාත් වීම.

ඔහුට සමථ ද විදර්ශනා ද යන මේ ධර්මයන් දෙදෙන යුගනද්ධව පහළ වේ.
යම් ධර්මයක් නුවණින් පිරිසිඳ දතයුත්තේ නම් එම ධර්මයන් පිරිසිඳව දැනගනී.
යම් ධර්මයක් නුවණින් ප්‍රහාණය කළ යුතු ද එම ධර්මයන් නුවණින් ප්‍රහාණය කෙරෙයි.
යම් ධර්මයක් නුවණින් වැඩිය යුතු ද එම ධර්මයන් නුවණින් වැඩීමට යේ.
යම් ධර්මයක් නුවණින් සාක්ෂාත් කළයුතු වේ ද එම ධර්මයන් නුවණින් සාක්ෂාත් කෙරේ.
කවර ධර්මයක් නුවණින් පිරිසිඳ දත යුතු ද? එනම් රූප උපාදානස්කන්ධය, වේදනා උපාදානස්කන්ධය, සංඥා උපාදානස්කන්ධය, සංඛාර උපාදානස්කන්ධය, විඤ්ඤාණ උපාදානස්කන්ධය නම් වූ පංච උපාදානස්කන්ධයයි. කවර ධර්මයක් නුවණින් ප්‍රහාණය කළ යුතු ද? අවිද්‍යාව ද භව තන්හාව ද යන ධර්මයන් නුවණින් ප්‍රහාණය කළ යුතුයි. කවර ධර්මයක් නුවණින් වැඩිය යුතු ද? සමථය ද විදර්ශනාව ද යන ධර්මයන් නුවණින් වැඩිය යුතුයි. කවර ධර්මයක් නුවණින් සාක්ෂාත් කළ යුතු ද? විද්‍යාව ද විමුක්තිය ද යන ධර්මයන් නුවණින් සාක්ෂාත් කළ යුතුයි.

අවිද්‍යා අන්ධකාරයෙහි බැසගැනීම.

විද්‍යා විමුක්තිය සාක්ෂාත් වීම.

පින් අනුමෝදනාව - මෙම සූත්‍ර දේශනාවේ ගැඹුරු ධර්ම කොටස් මැනවින් අවබෝධකර ගැනීමට අති පූජ්‍ය මාන්කඩවල සුදස්සන ස්වාමින්වහන්සේගේ මහා සළායතනික සූත්‍ර දේශනාව බොහෝ වාරයක් ශ්‍රවණය කළෙමි. උන් වහන්සේටද, මේ රූ සටහනේ ඇති ධර්ම කරුණු ඒ ආකාරයෙන්ම මතු කර දැක්වීමට මග පෙන්වූ මාගේ කල්‍යාණ මිත්‍ර ජයන්ත රත්නායක මහතාටද, මාගේ බිරිඳටද, මෙය බෙදාහරින ඔබ සැමටද මේ භවයේදීම නිර්වාණය අවබෝධය පතනෙමි. මලිත් පුතුට නිරෝගී සුව....
web - www.kalanamithuro.com facebook - kalanaworld email - thusitha@free.fr France

දුතිය චේතනා සූත්‍රය

සංයුක්ත නිකාය දෙවැනි කාණ්ඩය, පිටුව අංක 102.

මීට උපකාරක සූත්‍ර වශයෙන් මහාසළායතනික සූත්‍රය ද පටිසම්භිදාමග්ග ඥාන කතා හි (15-16) එන කරුණු ද සම්බන්ධ කෙරුණි.

දුක

සමුදය

චේතෙති පකප්පෙති අනුසේති

එහෙයින් මෙය

විඤ්ඤාණයේ පැවැත්මට අරමුණුවේ. අරමුණ ඇති කල්හි විඤ්ඤාණයේ පිහිටීම වේ.

විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාමරූප වේ.

නාමරූප ප්‍රත්‍යයෙන් සළායතන වේ.

සළායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශය වේ.

ස්පර්ශ ප්‍රත්‍යයෙන් වේදනාව වේ.

වේදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වේ.

තෘෂ්ණාව ප්‍රත්‍යයෙන් උපාදාන වේ.

උපාදාන ප්‍රත්‍යයෙන් භවය වේ.

භව ප්‍රත්‍යයෙන් ජාතිය වේ.

ජාතිප්‍රත්‍යයෙන් ජරා මරණ දුක්ඛ දෝමනස්ස උපායාසයෝ හටගනිත්. මෙසේ මේ දුක් රැසේ හට ගැනීම වේ.

1. කාමරාග

2. භාවරාග

3. පටිඝ

4. මාන

5. දිට්ඨි

6. විචිකිච්චා

7. අවිජ්ජා

(අනුසෙති) අනුශය ධර්ම පවත්වයි ද

(චෙතෙති පකප්පෙති) සිතයි ද, කල්පණා කරයි ද,

එනමුදු

(නො චෙ චෙතෙහි නෙ චෙ පකප්පෙති) නොසිතයි ද, කල්පණා නොකරයි ද,

දුතිය චේතනා සූත්‍රය යම් තැනැත්තෙක්

ආරම්මණයන් කෙරෙහි

රූපාරම්මණ

ශබ්දාරම්මණ

ගන්ධාරම්මණ

රසාරම්මණ

පොට්ඨබ්බාරම්මණ

ධම්මාරම්මණ

වත්ථුනානත්තඤාණය සහ ගෝචරනානත්තඤාණය

අනුශය ධර්ම නොපැවැත්වීමටනම්

ලෝකෝත්තර සම්මාදිට්ඨියට පැමිණිය යුතු වේ.

ඒ සඳහා ආරම්මණයන් කෙරහි පහත කරුණු අවබෝධ කරගතයුතුය. (පටිසම්භිදාමග්ග ඥාන කතා)

අධ්‍යාත්මික හා බාහිර ආරම්මණයන් බාහිර යයි සැලකීම.

අවිද්‍යාවෙන්, කර්මයෙන්, තණ්හාවෙන්, ආහාරයෙන් සෑදුනු දෙයක් සේ දැකීම.

සතර මහා භූතයන්ගේ උපාදාය රූපයන් ලෙස දැකීම.

පෙර නොතිබීම හටගෙන ඉතිරි නැතිව නිරුද්ධ වෙන දෙයක් සේ දැකීම.

නිරෝධය

මාර්ගය

(නො චෙ චෙතෙති නො චෙ පකප්පෙති නො චෙ අනුසෙති) නොසිතයි ද, කල්පනා නොකරයි ද, අනුශය ධර්ම නො පවතියිද

විඤ්ඤාණයේ පැවැත්මට අරමුණ නො වේ. අරමුණ නැති කල්හි විඤ්ඤාණයේ පිහිටීම නොවේ.

විඤ්ඤාණ නිරෝධයෙන් නාමරූප නිරෝධ වේ.

නාමරූප නිරෝධයෙන් සළායතන නිරෝධ වේ.

සළායතන නිරෝධයෙන් ස්පර්ශය නිරොධ වේ.

ස්පර්ශ නිරොධයෙන් වේදනාව නිරෝධ වේ.

වේදනා නිරෝධයෙන් තෘෂ්ණාව නිරෝධ වේ.

තෘෂ්ණා නිරෝධයෙන් උපාදාන නිරෝධ වේ.

උපාදාන නිරෝධයෙන් භවය නාරෝධ වේ.

භව නාරෝධයෙන් ජාතිය නිරෝධ වේ.

ජාති නිරෝධයෙන් ජරා මරණ දුක්ඛ දෝමනස්ස උපායාසයෝ නිරෝධ වෙත්. මෙසේ මේ දුක් රැසේ නිරෝධය වේ.

මහාසළායතනික සූත්‍රය

සත්තිස් බෝධිපාක්ෂික ධර්ම වැඩීම

එසේ ආර්ය අෂ්ඨාංගික මාර්ගය වඩනා ඔහුට
සතර සතිපට්ඨානය ද භාවනායෙන් පිරීමට යේ.
සතර සම්‍යක් ප්‍රධානයන් ද වැඩීමෙන් පිරීමට යේ.
සතර ඉර්ධිපාදයන් ද වැඩීමෙන් පිරීමට යේ.
පඤ්ච ඉන්ද්‍රියන් ද වැඩීමෙන් පිරීමට යේ.
පඤ්ච බලයන් ද වැඩීමෙන් පිරීමට යේ.
සප්ත බොජ්ඣඞ්ගයන් ද වැඩීමෙන් පිරීමට යේ.

ආර්ය අෂ්ඨාංගික මාර්ගය වැඩීම

එබඳු වූ කෙනාගේ යම් දෘෂ්ඨියක් ඇත්ද එය ඔහුට සම්මාදිට්ඨිය වේ.
යම් සංකල්පයක් ඇත්ද එය ඔහුට සම්මාසංකල්පය වේ.
යම් වායාමයක් ඇත්ද එය ඔහුට සම්මාවායාමය වේ.
යම් සතියක් ඇත්ද එය ඔහුට සම්මාසතිය වේ.
යම් සමාධියක් ඇත්ද එය ඔහුට සම්මාසමාධිය වේ.
ඔහුගේ කාය කර්මය ද වචී කර්මය ද ආජීවය ද පිරිසිදු වේ.
මෙසේ ඔහුට ආර්ය අෂ්ඨාංගික මාර්ගය භාවනායෙන් වැඩීමට යේ.

ජානං පස්සං යථාභූතං

ඒ ඒ ආයතනයන්, ගෝචර අරමුණු, අරමුණු දැන ගන්නා සිත් හා ඒ ඒ ආයතනයන්හි ස්පර්ශය යථාභූතව එනම් ඇත්ත ඇති සැටියෙන් දන්නා දක්නා කෙනා (ජානං පස්සං යථාභූතං) ඒ ඒ තැන්වල හට ගන්නා සැපෙහි හෝ දුකෙහි හෝ උපේක්ෂා විඳීම්හි හෝ මෙන්ම එම ආයතනයන්ගේ හෝ එහි ගෝචර රූපයන්ගේ හෝ එම විඤ්ඤාණයේ හෝ ස්පර්ශයේ හෝ නොඇලී මුලා නොවී ආදීනව දකිමින් වාසය කරයි.

සමථ විදර්ශනා යුගනද්ධව වැඩීම හා විද්‍යා විමුක්තිය සාක්ෂාත් වීම.

ඔහුට සමථ ද විදර්ශනා ද යන මේ ධර්මයන් දෙදෙන යුගනද්ධව පහළ වේ.
යම් ධර්මයක් නුවණින් පිරිසිඳ දතයුත්තේ නම් එම ධර්මයන් පිරිසිඳව දැන ගනී.
යම් ධර්මයක් නුවණින් ප්‍රහාණය කල යුතු ද එම ධර්මයන් නුවණින් ප්‍රහාණය කෙරයි.
යම් ධර්මයක් නුවණින් වැඩිය යුතු ද එම ධර්මයන් නුවණින් වැඩිමට යේ.
යම් ධර්මයක් නුවණින් සාක්ෂාත් කළයුතු වේ ද එම ධර්මයන් නුවණින් සාක්ෂාත් කෙරේ.
කවර ධර්මයක් නුවණින් පිරිසිඳ දත යුතු ද? එනම් රූප උපාදානස්කන්ධය, වේදනා උපාදානස්කන්ධය, සංඥා උපාදානස්කන්ධය, සංඛාර උපාදානස්කන්ධය, විඤ්ඤාණ උපාදානස්කන්ධය නම් වූ පංච උපාදානස්කන්ධය යි. කවර ධර්මයක් නුවණින් ප්‍රහාණය කල යුතු ද? අවිද්‍යාව භව තන්හාව ද යන ධර්මයන් නුවණින් ප්‍රහාණය කල යුතුයි. කවර ධර්මයක් නුවණින් වැඩිය යුතු ද? සමථය ද විදර්ශනාව ද යන ධර්මයන් නුවණින් වැඩිය යුතුයි. කවර ධර්මයක් නුවණින් සාක්ෂාත් කළ යුතු ද? විද්‍යාව ද විමුක්තිය ද යන ධර්මයන් නුවණින් සාක්ෂාත් කළ යුතුයි.

පුණ්‍යානුමෝදනාව - සංයුක්ත නිකායේ ඉතා කෙටියෙන් දක්වා ඇති මෙම සූත්‍ර දේශනාවේ ඇති ගැඹුරු බව අවබෝධ වුයේ අති පූජ්‍ය මාන්කඩවල සුදස්සන ස්වාමීන් වහන්සේගේ 2014 මාර්තු 16 වන දින පැවැත් වූ ධර්ම දේශනයකට උන්වහන්සේගේ දේශනා සඳහා වෙන් වූ අන්තර්ජාල වෙබ් අඩවියක් වන www.sudassana.org තුලින් සවන්දීමෙනි. උන් වහන්සේහට නිදුක් නිරෝගී සුවය හා දීර්ඝායුෂ පතමි. මෙම ධර්මදානමය පින ද උන්වහන්සේට අනුමෝදන් කරමි. එමෙන්ම මෙම කරුණු හැකි තරම් දුරට නිවැරදිව ඔබ වෙත ගෙන ඒමට සහාය දෙන මා කල්‍යාණ මිත්‍ර ජයන්ත රත්නායක මහතාටත්, ශිල්ප සතර දී හැදු වැඩූ මාගේ දෙමාපියන්ටත් ගුරුවරුන්ටත් මා දයාබර බිරිඳටත්, මෙය බෙදා හරින ඔබ සැමටත් මෙම රූ සටහන් විශාල කර මුද්‍රණය කළ හැකි පරිදි සකසාදීමට කටයුතු කරන කල්‍යාණ මිත්‍ර වසන්ත රාමනායක මහතාටත් මෛත්‍රිය පෙරදැරිව සෙත් පතමි.
මලිත් පුතුට නිරෝගී සුව...! www.kalanamithuro.com

මජ්ඣෙඩ (මජ්ජේ) සූත්‍රය

අංගුත්තර නිකාය සතර වෙනි කාණ්ඩය පිටුව සිංහල 187-189

සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කොට වදාළ මධ්‍යම ප්‍රතිපදාව ගැන
අවබෝධයක් ලැබිය හැකි සූත්‍ර දේශනාවක් (අත්හල යුතු අන්ත දොළස)

අන්ත දෙක

1 | 2

මධ්‍යය
(මෙහි ද නොඇලිය යුතුය)

1	මධ්‍යය	2
ස්පර්ශය	ස්පර්ශය නිරෝධය	ස්පර්ශය සමුදය
අතීතාත්මභාවය (අතීතය)	ප්‍රත්‍යුත්පන්නාත්මභාවය (වර්තමානය)	අනාගතාත්මභාවය (අනාගතය)
සුඛ වේදනාව	අදුක්ඛමසුඛ වේදනාව	දුක්ඛ වේදනාව
නාමය	ප්‍රතිසන්ධි විඥාණය	රූපය
අධ්‍යාත්මික ආයතන සය	කර්ම විඥාණය	බාහිර ආයතන සය
සක්කාය	සක්කාය නිරෝධය (පංචඋපදානස්කන්ධයෙහි නිරෝධය)	සක්කාය සමුදය

තෘෂ්ණාව නම් වූ සිබ්බනිය (මැහුම් කාරිය)

ඉහත අන්තයන් ප්‍රඥාවෙන් දැන මධ්‍යයයෙහි නොතැවරේ නම් ඔහු "මහා පුරුෂයා" යැයි ද ඔහු මෙම පංචස්කන්ධයෙහි සිබ්බනි සංඛ්‍යාත තෘෂ්ණාව ඉක්මගියේ යැයි ද බුදුන් වහන්සේ විසින් වදාරණ ලද සේක.